රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය / විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

**ACL 22523 / 22633 - ඉන්දියාවේ පැරණි කලා ශිල්ප සහ වාස්තුවිද්‍යාව**

<u>එක් කොටසකින් ප්‍රශ්න දෙක **(02)**</u> බැගින් තෝරාගෙන <u>ප්‍රශ්න හතරකට **(04)**</u>
පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය.

කාලය : පැය **03**

---

## <u>I කොටස</u>

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ ඉන්දීය මානවයින්ගේ සමාජ සංස්ථාවන් හැදෑරීමේ දී ගිරි සිතුවම්වලින් (Rock Art) කවර පිටුබලයක් ලැබේ දැ යි විමසන්න.

(ලකුණු 15)

2. ඉන්දීය ප්‍රථම නාගරිකයන් වශයෙන් ඉන්දු නිම්න වැසියන් සතුව තිබූ කලාත්මක හැකියාවන් කෙසේ වී දැයි උදාහරණ ගෙනහැර දක්වමින් පරීක්ෂා කරන්න.

(ලකුණු 15)

3. මෞර්ය යුගයේ නිර්මිත රාජ්‍ය අනුග්‍රහය ලද කලා කෘති සහ ප්‍රාදේශීය ඇදහිලි ආශ්‍රිත කලා කෘති පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 15)

4. ස්තූප, තොරණ සහ ගරාදි යන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීමේ කෙරෙහි අවධානය යොමු කරමින් සුංග ආන්ද්‍ර සමයේ කලාත්මක ලක්ෂණ පරීක්ෂා කරන්න.

(ලකුණු 15)

## <u>II කොටස</u>

5. "ඉන්දීය වාස්තුවිද්‍යාවේ දෙවැනි අදියර මෞර්ය යුගයෙන් ආරම්භ වේ." විමසන්න.

(ලකුණු 15)

6. ඉන්දීය ස්තූපයේ ප්‍රභවය පැහැදිලි කර සාංචි ස්තූපයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 15)

7. දකුණු ඉන්දීය කලා ශෛලියේ (ද්‍රවිඩ ශෛලිය) පුරෝගාමීන් ලෙස පල්ලවවරුන් දායාද කළ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 15)

8. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකකට (02) සටහන් ලියන්න.

i. පූර්ව හරප්පා යුගයේ වාස්තුවිද්‍යාව
ii. ඉන්දු නිම්නයේ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්
iii. පිහිටි ගල හාරා නෙලූ චෛත්‍යශාලා
iv. ගුප්ත යුගයේ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්

(ලකුණු 7.5 x 2 = 15)

@@@@@@@@@@@@@@